# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

# තේ පර්යේෂණ මණ්ඩලය

## ඇබෑර්තු

**01. කළමනාකරණ සහකාර (ගබඩා පාලන) - (තනතුරු 02)**

තලවාකැලේ, තේ පර්යේෂණ ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. කළමනාකරණ සහකාර (ගබඩා පාලනය)**

**රැකියා විස්තරය :**

ආයතනයේ කළමනාකරණ හා තාක්ෂණික කටයුතු වලට පහසුකම් සැලසීමට, සහායවීම හා අනිවාර්ය සේවා සැපයීම සඳහා තාක්ෂණික ස්වභාවයේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි.

**බාහිර :**

ගබඩා කළමනාකරණය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයේ පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 05 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර :**

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**වැටුප් පරිමාණය :**

MA 2-2 (2016) රු. 30,310 - 10 x 300 - 7 x 350 - 4 x 600 - 20 x 710 - රු. 52,360/-

**වයස :**

වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ)

**බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත තරගකාරී විභාගයකින් සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**වෙනත් ප්‍රතිලාභ :**

i. නවාතැන් පහසුකම් (සම්පූර්ණ ගෘහ භාණ්ඩ සහිත නිල නිවාස / නේවාසිකාගාර කාමර) තිබේ නම් සපයනු ලැබේ. නැතහොත් නවාතැන් පහසුකම් වෙනුවට දීමනාවක් ගෙවනු ලැබේ.

ii. ආයතනයේ වෛද්‍ය යෝජනාක්‍රමයේ පවතින රෙගුලාසි වලට අනුකූලව වෛද්‍ය ප්‍රතිලාභ හිමිවේ.

iii. **අර්ථසාධක අරමුදල :** තෝරා ගනු ලබන අයදුම්කරුවන් සේවක මණ්ඩල අර්ථසාධක අරමුදලට තම වැටුපෙන් 10% කින් දායක විය යුතු අතර, ආයතනය 15% කින් දායක වනු ඇත. ආයතනය සේවක භාරකාර අරමුදලට 3% කින් ද දායක වනු ඇත.

iv. තේ පර්යේෂණ ආයතනයේ තනතුරට අදාළ අමතර ප්‍රතිලාභ

තනතුරු ස්ථිරය. සම්පූර්ණ ජීව දත්ත ඇතුළත් අයදුම්පත්, උප්පැන්න සහතිකයේ පිටපතක්, අදාළ අධ්‍යාපනික සහ අනෙකුත් වෘත්තීය සුදුසුකම් සේවා සහතිකවල පිටපත් හා අයදුම්කරුවන්ගේ අදාළ ක්ෂේත්‍රයේ නිපුණතා සහ දක්ෂතා තක්සේරු කළහැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමඟ ඉදිරිපත් කළ යුතුය.

රාජ්‍ය සේවයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල සේවයේ නියුතු නිලධාරීන් නම් අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. මෙම අවශ්‍යතාවය හා අනුකූල නොවීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වනු ඇත.

තේ පර්යේෂණ ආයතනයේ www.tri.lk වෙබ් අඩවියට පිවිස ගූගල් ආකෘතියෙන් (google form) ඉල්ලා ඇති තොරතුරු උඩුගත (upload) කොට පසු කටයුතු සඳහා ආධාරක ලිපිලේඛන සමඟ සම්පූර්ණ කළ අයදුම්පත් 2023 මැයි 16 දින හෝ ඊට පෙර පහත අත්සන් කරන අය වෙත තැපැල් මඟින් ලැබෙන්නට සලස්වන්න. ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කරන්න.

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කුම්බිස්, තලවාකැලේ.**